# ආණ්ඩුවේ මැතිවරණ ව්‍යාපාරයට බන්ධනාගාර රැඳවියන් 50 ක් යොදාගෙන

PAFFREL

**පැෆරල් සංවිධානයෙන් මැතිවරණ කොමසාරිස්ට ලිපියක්**

අකිත පෙරේරා

ආණ්ඩුවේ මැතිවරණ ව්‍යාපාරය සඳහා මාතරදී බන්ධනාගාර රැඳවියන් 50 දෙනකු පමණ යොදවා ගෙන ඇතැයි පැෆරල් සංවිධානය මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යොමු කරමින් කියා සිටී.

අකුරැස්ස නගරයේදී බන්ධනාගාර හා පුනරුත්ථාපන ඇමැති චන්ද්‍රසිරි ගජධීර මහතා විසින් පෙරේදා (14 වැනිදා) සංවිධානය කර තිබූ එජනිස ප්‍රචාරක රැස්වීමක වේදිකාව නිර්මාණය කිරීම සඳහා මෙලෙස රැඳවියන් යොදාගෙන ඇතැයි එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසයි.

මෙය බන්ධනාගාර ආඥා පනත මෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් උල්ලංඝනය කිරීමක් බවද මේ පිළිබඳව සොයා බලා සුදුසු පියවර ගන්නා ලෙසද එම සංවිධානය වැඩිදුරටත් කියා සිටී.